ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අ.පොස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

33 - ඉතිහාසය

I පත්‍රය - ලකුණු 1 x 40 = ලකුණු 40

II පත්‍රය -

I කොටස

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

(අ) කොටස - ලකුණු 18
(ආ) කොටස - ලකුණු 12
ලකුණු 30

II කොටස

ප්‍රශ්න අංක 2 - ලකුණු 18
ප්‍රශ්න අංක 3 - ලකුණු 18
ප්‍රශ්න අංක 4 - ලකුණු 18
ප්‍රශ්න අංක 5 - ලකුණු 18
ප්‍රශ්න අංක 6 - ලකුණු 18
ප්‍රශ්න අංක 7 - ලකුණු 18

(ඕනෑම ප්‍රශ්න 4කට)
4 x 18 = ලකුණු 72

III කොටස

ප්‍රශ්න අංක 8 - ලකුණු 18
ප්‍රශ්න අංක 9 - ලකුණු 18

(ඕනෑම ප්‍රශ්න 1කට)
1 x 18 = ලකුණු 18

ලකුණු 120

අවසාන ලකුණු ගණනය කිරීම

* සමස්ත පිළිතුරු පත්‍රයේ අවසන් ලකුණ මණ්ඩලය තුළ දී ගණනය කිරීම සිදු නොකෙරේ.

අ.පොස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) .... √ △ 4/5

(ii) .... √ △ 3/5

(iii) .... √ △ 3/5

03 එකතුව → □ 10/15

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

වයුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඔවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

I පත්‍රය - ඉගෙනුම් පල

- ඉතිහාසය 10 සහ 11 ශ්‍රේණිවලට අදාල විෂය නිර්දේශවල ඇතුලත් ඉගෙනුම් පල ආවරණය වන පරිදි ඓතිහාසික සිද්ධීන් හා සංකල්ප පිළිබඳ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණ, සංස්ලේෂණ හැකියා පිරික්සීම

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ඉතිහාසය	I
வரலாறு	I
History	I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

උපදෙස්:

- **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ශ්‍රී ලංකා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
(1) මහාවංසය ය. (2) දීපවංසය ය. (3) ධාතුවංසය ය. (4) ථූපවංසය ය.

2. ගල් තලා මත ලියා ඇති අභිලේඛන හඳුන්වනු ලබන්නේ කිනම් නමකින් ද?
(1) ගිරි ලිපි (2) ලෙන් ලිපි (3) ටැම් ලිපි (4) පුවරු ලිපි

3. ආදී බ්‍රාහ්මී සෙල්ලිපියක 'පුර කමත' නමින් හඳුන්වා ඇති නිලධාරියා වූයේ නගරයේ,
(1) පාලනය භාරව සිටි පුද්ගලයා ය. (2) ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ය.
(3) වෙළෙඳ කටයුතු භාර ප්‍රධානියා ය. (4) ප්‍රධාන වාස්තු ශිල්පියා ය.

4. ප්‍රාග් ඓතිහාසික මානවයන් වාසය කළේ යැයි සැලකෙන ස්ථාන අතුරෙන් වඩාත්ම පැරණි ස්ථාන වන්නේ,
(1) කිතුල්ගල බෙලිලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස ය.
(2) පාහියන්ගල හා කුරුවිට බටදොඹලෙන ය.
(3) අත්තනගොඩ අළුලෙන හා මානියම්ගම ය.
(4) සීගිරිය පොත්තාන හා සීගිරිය අලිගල ය.

5. රාජ්‍ය උරුමය පියාගෙන් පසු පුතාට හිමි වූ අවස්ථාවක් වන්නේ,
(1) දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජවීමයි.
(2) කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජවීමයි.
(3) පළමුවන විජයබාහු රජුගෙන් පසු පළමුවන පරාක්‍රමබාහු රජවීමයි.
(4) පළමුවන විමලධර්මසූරිය රජුගෙන් පසු සෙනරත් රජවීමයි.

6. නිශ්ශංකමල්ල රජතුමා විසින් භාවිත කළ රාජ්‍යත්ව සංකල්පය කුමක් ද?
(1) දේවත්ව (2) චක්‍රවර්තී (3) බෝධිසත්ව (4) පර්වතරාජ

7. ගල් ගුහා, වාසස්ථාන ලෙස සකස් කිරීමේදී ගල මතුපිටට වැටෙන වැසි ජලය ගුහාව තුළට ගලා ඒම වැළැක්වීමට අනුගමනය කළ ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) ගල් ගුහාව ඇතුළට හැරීම (2) ගුහාව වටකර වරිච්චි බිත්ති බැඳීම
(3) ගල් ගුහාවේ කටාරම් කෙටීම (4) කළු ගල් යොදා ගුහාව ආවරණය කිරීම

8. ශ්‍රී දන්ත ධාතුව රැගෙන හේමමාලා කුමරිය හා දන්ත කුමරු ගොඩබට වරාය කුමක් ද?
(1) මාතොට (2) ගෝකණ්ණතිත්ථ (3) දඹකොලපටුන (4) ලංකාපටුන

9. රළපනාව මගින් ඉටුවන කාර්යය වන්නේ,
(1) වැව් බැම්ම සේදීයාම වැළැක්වීමයි.
(2) සොරොව්වට ඇතිවන ජල පීඩනය සමනය කිරීමයි.
(3) වැවෙහි අතිරික්ත ජලය පිට කිරීමයි.
(4) වැවෙහි එකතුවන රොන්මඩ ඇළවල්වලට ගලායාම වැළැක්වීමයි.

10. අඹන් ගඟ හරස් කර ඉදිකරන ලද ඇළ මාර්ගය වන්නේ,
(1) යෝධ ඇළයි. (2) මිනිපේ ඇළයි. (3) අංගමැඩිල්ල ඇළයි. (4) ඇළහැර ඇළයි.

11. පහත A සිට D දක්වා වූ නිර්මාණ අතුරෙන් පැරණි ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය භාවිතයේ පරිණත අවස්ථාව සඳහා නිදසුන් ඇතුළත් පිළිතුර කුමක් ද?
A – මැටි ඔරු සුසාන
B – සීගිරියේ ජල මල්
C – වර්ණාලේපිත මැටි බඳුන
D – කුට්ටම් පොකුණ
(1) A හා C (2) B හා C (3) B හා D (4) C හා D

12. ස්වභාවික පරිසර ක්‍රියාවලිය පිළිබඳ දැනුම, තාක්ෂණය සඳහා භාවිත කළ අවස්ථාවක් වන්නේ,
(1) රුවන්වැලිසෑයේ අත්තිවාරම සැකසීමයි.
(2) මල්වතු ඔය හරහා ගල් පාලමක් ඉදිකිරීමයි.
(3) බලංගොඩ සමනළ වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උදුන් සැකසීමයි.
(4) දැදිගම කොටවෙහෙර ඇත් පහන නිර්මාණය කිරීමයි.

13. 'දකපති' නමැති බදු වර්ගය අය කරනු ලැබුවේ මින් කුමක් සඳහා ද?
(1) හේන් වගා කිරීම
(2) වැව්වල ජලය භාවිත කිරීම
(3) රජුට අයත් ඉඩම්වල වගා කිරීම
(4) ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම

14. අතීත ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ නීති ඇතුළත් ශිලා ලේඛනයක් වන්නේ,
(1) සොරබොරවැව ටැම් ලිපියයි.
(2) මිහින්තලා පුවරු ලිපියයි.
(3) වේවැල්කැටිය සෙල්ලිපියයි.
(4) ගොඩවාය සෙල්ලිපියයි.

15. උස් බිම්වල වනාන්තර කැපීම නොකළ යුතු බවට නීති පැනවීමෙන් අතීත රජවරු බලාපොරොත්තු වූයේ,
(1) ජල උල්පත් සිඳියාම වළක්වා ගැනීම ය.
(2) වැව්වලට රොන්මඩ එකතුවීම වළක්වා ගැනීම ය.
(3) වන සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා කර ගැනීම ය.
(4) වගාබිම්වල පස නිසරුවීම වළක්වා ගැනීම ය.

16. ජෝතිය සිටුවරයාගේ කැරැල්ල ඇති වූයේ මින් කිනම් රාජ්‍ය සමයකදී ද?
(1) පළමුවන විජයබාහු
(2) පළමුවන පරාක්‍රමබාහු
(3) හයවන පරාක්‍රමබාහු
(4) හයවන විජයබාහු

17. මහනුවර රාජධානියේ ඉඩම්, ඒවායේ අයිතිය හා භුක්තිය පදනම් කර බෙදුනු කොටස් I තීරුවේ ද, ඒ එක් එක් කොටස පිළිබඳ පැහැදිලි කිරීම II තීරුවේ ද දක්වා ඇත. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

I තීරුව	II තීරුව
1. ගබඩාගම්	A – රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම්
2. නින්දගම්	B – විහාරාරාම සඳහා පූජා කළ ඉඩම්
3. විහාරගම්	C – රජු සහ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම්
	D – දේවාල සඳහා පූජා කළ ඉඩම්

(1) A C D (2) B D A (3) C A B (4) C B D

18. පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට යාපන ප්‍රදේශයේ පාලකයා වූයේ,
(1) පරරාජසේකරම ය. (2) එදිරිමානසිංහම ය. (3) සංකිලි ය. (4) පුවිරාජපණ්ඩරම ය.

19. ක්‍රි.ව. 1848 නිදහස් අරගලයෙන් පසු දේශීය ජනතාවට සහන සැලසීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව ගත් ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) අත්අඩංගුවට ගත් දේශීය නායකයන් නිදහස් කිරීම ය.
(2) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ය.
(3) ගොවි ජනතාවගේ ගැටලු විසඳීමට කමිටුවක් පත් කිරීම ය.
(4) බදු වර්ග කිහිපයක් අහෝසි කිරීම ය.

20. 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේදී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හැඳින්වූ නම කුමක් ද?
(1) ව්‍යවස්ථාදායක සභාව
(2) රාජ්‍ය මන්ත්‍රණ සභාව
(3) ජාතික රාජ්‍ය සභාව
(4) සෙනෙට් සභාව

21. බෞද්ධාගමික පුනරුදය සඳහා අනගාරික ධර්මපාලතුමාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමට කටයුතු කිරීමයි.
(2) බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමයි.
(3) පංච මහා වාද සඳහා අනුග්‍රහය දැක්වීමයි.
(4) වෙසක් පෝය නිවාඩු දිනයක් බවට පත් කිරීමට කටයුතු කිරීමයි.

22. ආරුමුග නාවලර්තුමා විසින් යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ,
(1) හින්දු සංස්කෘතිය දෙමළ සිසුන් අතර ප්‍රචාරය කිරීම ය.
(2) දක්ෂතා ඇති දෙමළ සිසුන් සඳහා නොමිලේ අධ්‍යාපනය ලබාදීම ය.
(3) දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට පාසලක් පිහිටුවීම ය.
(4) දෙමළ සිසුන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම ය.

23. ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා ටී. බී. ජයා මහතාගෙන් ඉටු වූ සේවාවක් වන්නේ,
(1) මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම ය.
(2) මුස්ලිම් ජනතාව වෙනුවෙන් පාසල් පිහිටුවීම ය.
(3) මුස්ලිම් කාන්තා විද්‍යාල ආරම්භ කිරීම ය.
(4) කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීම ය.

24. සූරියමල් ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී ආබාධිත බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ට ආධාර එකතු කිරීමේ ව්‍යාපාරයක් වීම
(2) ශ්‍රී ලංකාවේ නිදහස සඳහා ගෙනගිය උද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරයක් වීම
(3) යුධ සාමදාන දිනය සැමරීම සඳහා සූරියමල් විකිණීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම
(4) සූරියමල් විකිණීමෙන් ලැබෙන මුදල් බ්‍රිතාන්‍ය මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කිරීම

25. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් හඳුන්වා දෙනු ලැබූ ලක්ෂණයක් වන්නේ,
(1) පළාත්බද නියෝජනයයි.
(2) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයයි.
(3) සර්වජන ඡන්ද බලයයි.
(4) උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයයි.

26. පහත A සිට D දක්වා වූ කරුණු අතුරෙන් බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික වෙනස්වීම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
A – අපනයන වැවිලි බෝග හඳුන්වාදීම
B – කෘෂිකර්මාන්තය දියුණු කිරීම රජයේ ප්‍රධාන වගකීම වීම
C – ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම
D – රාජකාරි ශ්‍රම ක්‍රමය ක්‍රියාත්මක කිරීම
(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

27. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අරමුණක් වූයේ,
(1) වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අළුත්වැඩියා කිරීමයි.
(2) කෘෂි නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීමයි.
(3) ඉහළ යන විදුලිබල ඉල්ලුම සඳහා විදුලිබලය නිෂ්පාදනය කිරීමයි.
(4) සුළු අපනයන බෝග වගා කිරීමට ඉඩම් වෙන් කිරීමයි.

28. පහත A සිට D දක්වා වූ මැතිවරණ අතුරෙන් සමස්ත ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාශයක් බවට පත්වන අවස්ථා දැක්වෙන පිළිතුර කුමක් ද?
A – ජනාධිපතිවරණය
B – මහ මැතිවරණය
C – පළාත් සභා මැතිවරණය
D – ජනමත විචාරණය
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

29. පුනරුද සමයේ විවිධ සොයාගැනීම් කළ පුද්ගලයන් අතුරෙන් ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ ප්‍රසිද්ධියට පත් වූයේ කවර ක්ෂේත්‍රයක ද?
(1) චිත්‍ර කලාව (2) වෛද්‍ය විද්‍යාව (3) සාහිත්‍යය (4) දේශ ගවේෂණය

30. පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් වන්නේ,
(1) ලෞකික රසවින්දනයට මුල්තැන දෙන කලා කෘති බිහිවීම ය.
(2) ශිල්පීන් අයත් වූ ශ්‍රේණිවල නමින් කලා නිර්මාණ එළිදැක්වීම ය.
(3) කලා කෘතිවලට අනුග්‍රහ දැක්වීමේ ශක්තිය පල්ලියට පමණක් තිබීම ය.
(4) කලා කෘති හා කලා ශිල්ප ආගමටම පමණක් නැඹුරු වීම ය.

31. කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය මගින් සිදු වූයේ,
(1) විශාල ඉඩම් කුඩා කොටස්වලට බෙදා වෙන් කිරීම ය.
(2) දිළින්දන් සතු ඉඩම් රදළයන් විසින් අත්පත් කරගැනීම ය.
(3) කාර්මික අවශ්‍යතා සඳහා ග්‍රාමීය ඉඩම් යොදාගැනීම ය.
(4) සුළු ගොවියන් සතු කුඩා ඉඩම් එකතු කර විශාල ගොවිපළවල් සකස් කිරීම ය.

32. පහත අදහස් ඇතුළත් දේශපාලන දර්ශනය ලොවපුරා ව්‍යාප්ත වූයේ කිනම් විප්ලවයෙන් පසු ද?

- සමාජය සතු ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය පිළිගැනීම
- සෑම පුරවැසියකුටම තම කුසලතා ඉහළ නංවා ගැනීමට සමාන ඉඩක් ලබාදීම
- නිෂ්පාදන ඵල සියලුදෙනාටම බෙදී යාම

(1) අමෙරිකන් නිදහස් සටන (2) ප්‍රංශ විප්ලවය
(3) රුසියානු විප්ලවය (4) ඉංග්‍රීසි විප්ලවය

33. දෙවන ලෝක යුද්ධ සමයේදී සෙසු ආසියානික රටවල් ආක්‍රමණය කළ ආසියානික රාජ්‍යය වූයේ,
(1) ජපානයයි. (2) චීනයයි. (3) මොංගෝලියාවයි. (4) කොරියාවයි.

34. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනයන්ට පැවරී ඇති කාර්යයන් කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරෙන් මහා මණ්ඩලයට අයත් කාර්යයන් දැක්වෙන පිළිතුර කුමක් ද?

A – එක්සත් ජාතීන්ගේ භාරකාර ක්‍රමය යටතට ගත් ප්‍රදේශ පාලනය කිරීම
B – එක්සත් ජාතීන්ගේ සංවිධානයට නව සාමාජිකයන් බඳවා ගැනීම
C – එක්සත් ජාතීන්ගේ ආයතනවලට අවශ්‍ය නීති උපදෙස් ලබාදීම
D – ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහලේකම් පත් කිරීම

(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

- පහත වගුවේ A සිට J දක්වා වූ තොරතුරු ඇසුරෙන් **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රජතුමා	ස්ථානය	හමුදා ප්‍රධානියා
A. පළමුවන රාජසිංහ	D. ගන්නෝරුව	G. ජෙරෙනිමෝ ද අසවේදු
B. පළමුවන විමලධර්මසූරිය	E. මුල්ලේරියාව	H. දියෝගෝ ද මෙලෝ
C. දෙවන රාජසිංහ	F. බලන	J. කොන්ස්තන්තීනු ද සා

35. ගන්නෝරුව සටනට සම්බන්ධ වූ උඩරට රජතුමා හා පෘතුගීසි හමුදා ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා H (2) B හා J (3) C හා G (4) C හා H

36. පළමුවන විමලධර්මසූරිය රජතුමා පෘතුගීසීන් සමඟ සටන් කළ ස්ථානය හා එහිදී පෘතුගීසි හමුදාව මෙහෙය වූ ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) D හා G (2) D හා J (3) E හා J (4) F හා G

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් **37** ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා උනන්දුවක් ඇති වීම
B – ලොව ප්‍රථම ලිඛිත සන්ධිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි වීම

37. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම
2. කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණ

B – 1. මැනිං ප්‍රතිසංස්කරණය
2. ව්‍යවස්ථාදායක සභාව හඳුන්වා දීම

C – 1. අග්‍රාණ්ඩුකාර ධුරය
2. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

D – 1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. සමානුපාතික නියෝජන ක්‍රමය

38. පළමුවැන්න දෙවැන්නේ ප්‍රතිඵලයක් බවට දැක්විය හැකි යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න මගින් දෙවැන්න හඳුන්වාදුන් බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

40. දෙවැන්න ක්‍රියාත්මක වීමත් සමඟ පළමුවැන්න අහෝසි වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පොස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2021 (2022)
I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம் 33

විෂයය / பாடம் ඉතිහාසය

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
01.	02	11.	03	21.	01	31.	04
02.	01	12.	03	22.	04	32.	03
03.	04	13.	02	23.	02	33.	01
04.	02	14.	01	24.	02	34.	04
05.	02	15.	01	25.	03	35.	04
06.	02	16.	03	26.	02	36.	04
07.	03	17.	03	27.	03	37.	03
08.	04	18.	01	28.	02	38.	01
09.	01	19.	04	29.	02	39.	04
10.	03/04	20.	03	30.	01	40.	03

විශේෂ උපදෙස් / විசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை **25** / **40**

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி **25** / **40**

II පත්‍රය

I කොටස

1. (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

කාලතිත්ථ, නාච්චදූව වැව, මැණික් ගඟ, පොළොන්නරුව, ගන්නෝරුව, දෙවුන්දර, කන්තරෝඩය (කදුරුගොඩ), සොරබොර වැව, ගෝකණ්ණ, කලා ඔය, හලාවත, කෝට්ටේ (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

බෙංගාල බොක්ක, තායිවානය, රෝමය, පෘතුගාලය, ලන්ඩන්, රතු මුහුද (ලකුණු 06 යි)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමය ලැබූ රජතුමා සඳහන් කරන්න.

B - ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් පිහිටුවීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ විදේශීය ජාතිකයා කවුරුන් ද?

C - පළමුවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු පරාජිත ජර්මනිය සමග අත්සන් කරන ලද ගිවිසුම කුමක් ද?

D - නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට මුල් වූ ඉන්දීය අගමැතිවරයා නම් කරන්න. (ලකුණු 04 යි)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A රූපයෙන් දැක්වෙන රජතුමාගේ නම සඳහන් කරන්න.
2. රජවීමට පෙර මෙතුමා හැඳින් වූ නම කුමක් ද?
3. මෙම රජතුමා අයත් වූ රාජවංශය කුමක් ද?
4. මෙතුමා විසින් දළදා මාළිගා සංකීර්ණයට එක් කරන ලද කලාත්මක නිර්මාණය සඳහන් කරන්න.

(ලකුණු 04 යි)



A

(iii) 1. B රූපයෙන් දැක්වෙන චිත්‍රයේ නිරූපණය වන්නේ කවුරුන් ද?
2. මෙය සිතුවම් කොට ඇති දේවස්ථානය නම් කරන්න.
3. මෙම චිත්‍රය සිතුවම් කළ චිත්‍ර ශිල්පියා සඳහන් කරන්න.
4. මෙම චිත්‍රය කිනම් යුගයකට අයත් වේ ද?

(ලකුණු 04 යි)



B

Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ඉතිහාසය	II
வரலாறு	II
History	II

1. (අ) (i)
1. (ஆ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index No. .....



1. (ඇ) (ii)
1. (ඈ) (ii)
1. (අ) (ii)

I කොටස

(ආ)

(i) A - දෙවන පරාක්‍රමබාහු රජු

B - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා/ ඕල්කට්තුමා

C - වර්සායි/ වර්සෙල්ස් ගිවිසුම

D - ශ්‍රී ජවහර්ලාල් නේරු/ නේරු

(ලකුණු 01 X 04 = 04 යි.)

(ii) 1. ශ්‍රී වික්‍රමරාජසිංහ

2. කන්නසාමි

3. නායක්කර්

4. පත්තිරිප්පුව

(ලකුණු 01 X 04 = 04 යි.)

(iii) 1. දේව දරුවන් / දේව දරුවන්

2. සිස්ටයින්

3. රෆායල්/ මයිකල් ආංජිලෝ

4. පුනරුදය / පුනරුදය

(ලකුණු 01 X 04 = 04 යි.)

II කොටස

2. **ඉගෙනුම් පල :**

- ප්‍රාග් ඓතිහාසික යුගයේ මානව ජනාවාස පිහිටි ස්ථාන නම් කරයි.
- ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවන රටාව විස්තර කරයි.
- පූර්ව ඓතිහාසික යුගය හා ප්‍රාග් ඓතිහාසික යුගය වෙන් කර හඳුනා ගනියි.
- මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පිළිබඳ විස්තර කරයි.

2. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පරිසර කලාප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කර හඳුනාගත හැකි කරුණු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

I.

- අර්ධ ශුෂ්ක කලාපය
- පහතරට වියළි කලාපය
- පහතරට අතරමැදි වියළි කලාපය
- තෙත් කලාපය
- කඳුකර වියළි අතරමැදි කලාපය
- ශුෂ්ක කලාපය
- පහතරට ශුෂ්ක කලාපය
- පහතරට අතරමැදි තෙත් කලාපය
- තෙත් කඳුකර කලාපය
- තෙත් උස් කඳුකර කලාපය

(ලකුණු 01 x 3 = 03 යි.)

II.

- සතුන් දඩයම් කිරීම
- ආහාර සඳහා ස්වාභාවික ද්‍රව්‍ය එකතු කිරීම
- සංචාරක ජීවිතයක් ගත කිරීම
- වර්ෂා කාලයේ ස්වාභාවික ගල් ගුහාවල ජීවත් වීම
- වියළි කාලයේ විවෘත ස්ථානවල ජීවත් වීම
- කුඩා කණ්ඩායම් ලෙස ජීවත් වීම
- මළවුන් සම්බන්ධව අභිචාර විධි අනුගමනය කිරීම/ මළසිරුරු ගුහා තුළ වල දැමීම
- ආහාරයේ ස්වභාවය පරිසරය අනුව තීරණය වීම
- .....

(ලකුණු 2 X 2 = 04 යි.)

III.

- පිළිස්සූ මැටි වලං භාවිතය
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම
- යකඩ ලෝහ භාවිතය
- ස්ථීර ජනාවාස ඉදි කිරීම (ස්ථීරවාසීතාව)
- කෘෂිකර්මාන්තය ඇරඹීම
- .....

(ලකුණු 2 + 3 =05 යි.)

IV.

- කුඩා වැව් කේන්ද්‍ර කොට ව්‍යාප්ත වූ ජනාවාස පැවතීම (වාපීගම)
- ගංගාවල පිටාර නිම්නයන්ට පිටතින් ජනාවාස ව්‍යාප්ත වීම
- විවිධ වෘත්තීන් පදනම් කර ගනිමින් ජනාවාස බිහිවීම
- කාර්ය පදනම් කොට බිහිවූ ජනාවාස
- ස්වාභාවික සම්පත් සුලබතාව මත ජනාවාස ඇතිවීම
- පරික්ඛිත්ත ගම් හා අපරික්ඛිත ගම්
- විශාල නාගරික ජනාවාස (පුර) හා නගර ජනාවාස
- විශාලත්වයෙන් එකිනෙකට වෙනස් වූ ජනාවාස
  - කුඩා ප්‍රමාණයේ ගම් - 0.15 හෙක්ටයාර්
  - මධ්‍යම ප්‍රමාණයේ ගම් - හෙක්ටයාර 2
  - නාගරික ජනාවාස - හෙක්ටයාර 2ට වැඩි
- ජන සංඛ්‍යා ප්‍රමාණයෙන් විවිධ වූ ජනාවාස පැවතීම
  - කුඩා ගමක පවුල් 5 - 6
  - විශාල ගමක පවුල් 30
  - නාගරික ජනාවාස 35000ක ජනගහණයක්
- ජනාවාස, ගම්, නගර හා පුර වශයෙන් පැවතීම
- ගමික විසින් ගම පාලනය කිරීම
- ගම් ප්‍රධානීන් දහ දෙනෙකුගේ මණ්ඩලයකින් ගම් කිහිපයකින් සැදුම්ලත් ප්‍රදේශයක පරිපාලන ගැටලු විසඳීම

(ලකුණු 3+ 3 = 06 යි.)

03. ඉගෙනුම් පල :

- අතීත ශ්‍රී ලංකාවේ පාලනය හා සම්බන්ධ තනතුරු නාම සඳහන් කරයි.
- මුල් යුගයේ ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පාලකයන් සඳහන් කරයි.
- ශ්‍රී ලංකාවේ මුල් යුගයේ පාලකයන් පිළිබඳව හා ඔවුන් පැවැත්වූ විදේශ සබඳතා විස්තර කරයි.

3. (i) අතීත ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන පුද්ගලයන් හැඳින්වූ තනතුරු නාම **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A - පවුලක ප්‍රධානියා
B - ගමක නායකයා
C - කුඩා ප්‍රදේශයක් පාලනය කළ කාන්තාව (ලකුණු 03 යි)

(ii) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ රජවරුන් **අනුපිළිවෙළින්** සඳහන් කරන්න.

A - අනුරාධපුරය සැලසුම්ගත නගරයක් බවට පත් කිරීම
B - ශ්‍රී මහා බෝධි රෝපණය
C - මින්නේරිය වැව ඉදිකිරීම
D - පොළොන්නරුව චෝළ පාලනයෙන් මුදාගැනීම (ලකුණු 04 යි)

(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අනුරාධපුර හා පොළොන්නරු රාජධානිවල රජවරුන් විදේශ රටවල් සමග පැවැත්වූ සබඳතා නිදසුන් **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

I. A - ගහපති/ ගෘහපති

B - ගමික/ ග්‍රාමික / ග්‍රාම කෝරළ / ගම්මේ

C - පරුමකලු

(ලකුණු 01 X 03 = 03 යි.)

II. A - පණ්ඩුකාභය රජ

B - දේවානම්පියතිස්ස රජ/ දෙවනපෑතිස් රජ

C - මහසෙන් රජ

D - පළමුවන විජයබාහු රජ/ මහා විජයබාහු රජ / I වන විජයබා

(ලකුණු 01 X 04 = 04 යි.)

III.

- නව රාජ පෙළපතක ආරම්භය සිදුවීම / මහා කෝත්ත පෙදෙන ආරම්භ කරීම.
- දිවයින පුරා බලය පවත්වා ගෙන යාම
- රටේ අභ්‍යන්තර පාලනය විධිමත්ව සංවිධානය වී තිබීම
  - ශ්‍රී ලංකාව පළාත්වලට බෙදා පරිපාලනය කිරීම
  - පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කර ඒවා පාලනයට ඇමතිවරු පත් කර තිබීම.
- ක්‍රමවත්ව බදු අය කිරීම
- දේශීය ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කිරීම
- මහා පරිමාණයේ වැව් ඉදි කිරීමේ පුරෝගාමියා වීම
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය හා තැනවීම
- වෙහෙර විහාරවලට දීමනා ලබා දීම
- අන්තර් ජාතික/ කලාපීය අවශ්‍යතාවලට ගැලපෙන ලෙස කටයුතු කිරීම / ඒවා ඉදි කිරීම සිදු කිරීම

(ලකුණු 02 + 03 = 05 යි.)

IV. * / ආණ්ඩුවල සබඳතාවන් ලෙස වෙනස් කරන්න

- දෙවනපෑතිස් හා අශෝක රජතුමා අතර පැවති සබඳතා
  - ඉන්දීය පංච කකුධ භාණ්ඩ භාවිත කොට නැවත අභිෂේක වීම
  - දෙවනපිය විරුද නාමය භාවිතයට ගැනීම
  - මිහිදු හිමි බුදු දහම රැගෙන මෙරටට වැඩම කිරීම
- පළමුවන ගජබාහු රජ චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වීම
- කනිට්ඨතිස්ස/ භාතිකාභය රජු රෝම දේශය සමඟ තානාපති සබඳතා පවත්වා ගැනීම
- හයවන අග්ගබෝධි රාජ්‍ය සමයේ චීනය සමඟ වෙළඳ සබඳතා පවත්වා ගැනීම

- විවාහ සිදුකිරීම මගින් අසල්වැසි රටවල් සමග සබඳතා ඇති කර ගැනීම
  - පළමුවන විජයබාහු රජ තිලෝක සුන්දරි නම් කාලිංග වංශික කුමරිය විවාහ කර ගැනීම
  - මිත්තා කුමරිය පාණ්ඩ්‍ය දේශයේ කුමරෙකුට විවාහ කර දීම
- ආරක්ෂාව සඳහා වේලක්කාර හමුදාව යොදවා ගැනීම / කුලී හමුදා ලබා ගැනීම.
- අරාබි රටවල් සමග වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම
- .....

(ලකුණු 03 + 03 = 06 යි.)

04. ඉගෙනුම් පල :

- දෙවන නාගරිකරණ අවධියේ පැවති රාජධානි නම් කරයි.
- පළමු නාගරිකරණ අවධියට අයත් පැරණි නගර පරිහානියට බලපෑ කරුණු සඳහන් කරයි.
- දෙවන නාගරිකරණ අවධියේ ආර්ථික රටාවේ ලක්ෂණ හා එකල පාලකයන්ගේ සේවා විස්තර කරයි.

4. (i) දෙවන නාගරිකරණ අවධියේ පැවැති රාජධානි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන නාගරිකරණ අවධියට අයත් පැරණි නගර පරිහානියට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරිකරණ අවධියේ ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් ඉටු වූ සේවාවන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

I. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, යාපනය, රයිගම, සීතාවක
(පැබරිගොලපුර) (ගණ සරපුර)

(ලකුණු 1 X 3 = 3 යි)

II.

- මධ්‍යගත පාලනය බිඳ වැටීම
- ආරක්ෂාව නැති වීම
- වෙළෙඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම
- ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම
- දුර්වල පාලකයන් බලයට පත්වීම
- ආර්ථික පරිහානිය
- සතුරු ආක්‍රමණ/ කාලිංග මාඝ ආක්‍රමණය/ චෝළ ආක්‍රමණ
- රාජ වංශ අතර බල අඩපණ (කාලිංග / පාණ්ඩ්‍ය)

(ලකුණු 2 X 2 =4 යි)

III.

- ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මය වීම
- වගා කටයුතු සඳහා අහස් දිය යොදා ගැනීම
- වී වගාව ප්‍රධාන වීම, ජලය හිඟ ප්‍රදේශවල හේන් ගොවිතැන
- වානිජ ආර්ථික රටාවකට නැඹුරු වීම
- විදේශ වෙළෙඳ සබඳතා පැවතීම
  - අපනයන } වෙළෙඳ ද්‍රව්‍ය හා
  - ආනයන } රටවල්
- අභ්‍යන්තර වෙළෙඳාම පැවතීම

(ලකුණු 2 + 3 =5 යි)

IV.

- කෝට්ටේ රාජ්‍යය යටතේ රට එක් සේසත් කිරීම
  - වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කිරීම
  - සපුමල් කුමරු යවා යාපනය ජය ගැනීම
  - ජෝතිය සිටානන්ගේ කැරැල්ල මැඩ පැවත්වීම
- රට ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කිරීම
- බෞද්ධ අධ්‍යාපනික මධ්‍යස්ථාන පිහිටුවීම
- සාහිත්‍යයේ දියුණුවට කටයුතු කිරීම

(ලකුණු 3+ 3 =6 යි)

05. ඉගෙනුම් පල :

- මහනුවර රාජධානිය හැඳින්වූ පර්යාය නම් ද, එම රාජධානි සමයේ සිදුවූ ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පාලකයන් ද සඳහන් කරයි.
- මහනුවර රාජධානි සමයේ පාලකයන් මුහුණදුන් අභියෝග හා ඒවා ජය ගැනීමට ක්‍රියා කළ ආකාරය ද, එහි පරිපාලනය පිළිබඳ තොරතුරු ද විස්තර කරයි.

5. (i) මහනුවර රාජධානිය හැඳින්වීම සඳහා භාවිත කළ නම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A - මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා

B - මහනුවර රාජධානිය ආක්‍රමණය කිරීම සඳහා සීතාවක රාජසිංහ රජුට සහාය ලබාදුන් ප්‍රභූවරයා

C - දෝන කතිරිනා නමින් බෞතීස්ම ලැබූ කුමාරිකාව

D - ක්‍රි.ව. 1766 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇති කරගත් රජතුමා

(කරලියැද්දේ බණ්ඩාර, කීර්ති ශ්‍රී රාජසිංහ, කුසුමාසන දේවිය, වීරසුන්දර බණ්ඩාර, සේනා සම්මත වික්‍රමබාහු, සමුද්‍ර දේවිය, ශ්‍රී විජය රාජසිංහ, ජයවීර බණ්ඩාර) (ලකුණු 04 යි)

(iii) දෙවන රාජසිංහ රජු තම පාලන සමයේදී මුහුණදුන් අභියෝග **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** ජයගැනීම සඳහා කටයුතු කළ ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i)

- සෙංකඩගල නුවර
- උඩරට රාජධානිය
- කන්දෙ නුවර
- කන්ද උඩරට රාජධානිය
- කන්ද උඩ පස් රට
- නිර් වර්ධන ශ්‍රේණි / සංවර්ධන ශ්‍රේණි

(ලකුණු 01 x 3 = 03 යි.)

(ii)

A - සේනා සම්මත වික්‍රමබාහු

B - වීරසුන්දර බණ්ඩාර

C - කුසුමාසන දේවිය

D - කීර්ති ශ්‍රී රාජසිංහ

(ලකුණු 01 x 04 = 04 යි.)

(iii) **අභියෝග**

- පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම
  - මහා අස්ථාන කුමරු ලෙස රන්දෙනිවෙල සටනේදීත්, රාජ්‍යත්වයට පත්වීමෙන් පසු ගන්නෝරුව සටනේදීත් පෘතුගීසීන් පරාජයට පත් කිරීම
- පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම
  - ලන්දේසි සහාය ලබා ගැනීම
- උඩරට රදල ප්‍රධානීන්ගෙන් එල්ලවන තර්ජන අඩු කර ගැනීම
  - රදල ප්‍රධානීන්ගේ බලය වර්ධනය වීමට ඉඩනොදී රාජ්‍ය පාලනය සිදු කිරීම
- ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම
  - ලන්දේසීන්ට ප්‍රහාර එල්ල කොට ඔවුන් අල්ලා ගන්නා ලද ප්‍රදේශ නැවත උඩරට රාජ්‍යයට ඈඳා ගැනීම

(ලකුණු 02 + 03 = 05 යි.)

(iv)

- පරිපාලන සංවිධානයේ ප්‍රධානියා රජතුමාය
  - රටේ සාමය හා ආරක්ෂාව සැලසීම රජුගේ ප්‍රධාන කාර්යය විය
- පරිපාලන කටයුතුවලදී රජුට සහාය වීමට අදිකාරම්වරු දෙදෙනකු සිටීම
  - මහාදිකාරම් හා දෙවන අදිකාරම්
  - එක් එක් අදිකාරම්වරයා යටතේ ප්‍රදේශ පරිපාලනය වීම
- රාජ්‍ය කටයුතු රාජ සභාව මඟින් මෙහෙය වීම
  - ප්‍රධානත්වය රජතුමා
  - අදිකාරම්වරු, දිසාවේවරු, මහලේකම්, බද්දේලේකම්වරු

- මහ වාසල සේවය
  - රජ වාසල කටයුතු පවත්වා ගෙන යෑම සිදුවිය
  - රජුගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුවිය
- රට වසම කාර්යාංශය යටතේ ප්‍රදේශ පාලනය
  - රට හා දිසාව ලෙස ප්‍රදේශ බෙදා පාලනය
- බද්දේ සංවිධානය
  - දිසාව තුළ සිටි ශිල්පීන් හෝ කුලයන් ඔවුන්ගේ කාර්යය අනුව වෙනම සංවිධානය වීම

    උදා : මඩිගෙ බද්ද, කුරුවෙ බද්ද යනාදී
- විහාර දේවාල පාලන කටයුතු
- අධිකරණ කටයුතු
  - ඉහළම අධිකරණය රජු වීම
  - නිලය හා තනතුරු අනුව අධිකරණ බලතල හිමිවීම
  - දඩුවම් ක්‍රම ගණනාවක් පැවතීම

(ලකුණු 03 + 03 = 06 යි.)

06. ඉගෙනුම් පල :

- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමට පෙර මෙරටට පැමිණි බ්‍රිතාන්‍ය දූතයන් නම් කරයි.
- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ල පිළිබඳ ඉදිරිපත් වූ නිර්දේශ සඳහන් කරයි.
- බ්‍රිතාන්‍යයන් මහනුවර රාජධානිය අත්පත් කර ගැනීමට බලපෑ හේතු ද, ක්‍රි.ව. 1848 නිදහස් අරගලයට බලපෑ හේතු ද විස්තර කරයි.

6. (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් විසින් අත්පත් කරගැනීමට පෙර මෙරටට පැමිණි බ්‍රිතාන්‍ය දූතයන් **තිදෙනා** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව. 1797 දී මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල පිළිබඳ සොයා බැලූ මියුරන් කොමිසමේ නිර්දේශ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍යයන් විසින් මහනුවර රාජධානිය යටත් කරගැනීමට තුඩුදුන් සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1848 දී බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලයක් ඇතිවීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i)

- ජෝන් පයිබස් - පයිබස් විසින් ලබුදා නොදේ.
- හියුබොයිඩ්
- රොබට් ඇන්ඩෘස්

සම්පූර්ණ වේ නොදේ.

(ලකුණු 01 X 03 = 03 යි.)

(ii)

- බදු එකතු කිරීමට යොදවා සිටි මදුරාසි නිලධාරීන් ආපසු යවා ඒ සඳහා දේශීය නිලධාරීන් යොදවා ගැනීම
- පොල් ගස් බද්ද ඇතුළු අළුත් බදු වර්ග ඉවත් කිරීම (හොඳයි, රංචු, ලූදු කෑල්ල, කුරුඳු කෑල්ල)
- ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම
- මුල් ඉළිප්පා තෙක් සාක්ෂිය ගෙවීම බදු අය කිරීමයෙහි අවසන් විය.

(ලකුණු 02 X 02 = 04 යි.)

(iii)

- රටමැද ස්වාධීන රාජ්‍යයක් තිබීම මුහුදුබඩ ඉංග්‍රීසි පාලනයට බාධාවක් සේ සැලකීම
- වෙරළබඩ ප්‍රදේශ හා අභ්‍යන්තර දේශසීමා ආරක්ෂා කිරීමට විශාල මුදලක් දැරීමට සිදුවීම
- පහතරට කැරලි ඇති වූ විට උඩරට රජු ඒවාට සහාය දැක්වීම
- මුහුදුබඩ වැසියන් උඩරට රජතුමා තමන්ගේ රජු ලෙස සැලකීම
- කොළඹ සිට ත්‍රිකුණාමලය තෙක් ගොඩබිම් මාර්ගයක් ඉදි කිරීමට ඉංග්‍රීසීන්ට අවශ්‍ය වීම
- වෙනත් යුරෝපා ජාතියක සහය උඩරට රජු විසින් ලබා ගනීවි යැයි වූ සැකය
- වෙළඳ කටයුතු වලදී සහයක් බදු ගෙවීමට සිදු වීම.
- ශ්‍රී ලංකා රාජධානි රජුගේ ඇමැතිවරුන් සුදුයාළාවය
- ඉංග්‍රීසියන්ගේ උත්සාහයින් සුදුයාළාවය.
- රාළහාමි ඉංග්‍රීසීන්ට සහාය වීම.

(ලකුණු 02 + 03 = 05 යි.)

(iv)

- කෝල්බෘක් ප්‍රතිසංස්කරණවල බලපෑම
  - රජයේ ඉඩම් ප්‍රතිපත්තිය
  - ගම් සභාව අඩපණ වීම
  - නව අධිකරණ ක්‍රමය
- රජය හා මහජනතාව අතර සබඳතා දුරස්වීම
  - සිවිල් සේවා තනතුරු අඩු කිරීම හා නිලධාරීන්ගේ බල ප්‍රදේශ විශාල වීම නිසා අධීක්ෂණය හා පරිපාලනය නිසි පරිදි සිදු නොවීම
  - ඇතැම් නිලධාරීන් වගා කටයුතු ගැන උනන්දු වීම නිසා මහජන අවශ්‍යතා සොයා බැලීමට නොහැකි වීම
- රජයේ නව බදු ප්‍රතිපත්තිය —
- වතු වගාව නිසා ජනතාවගේ කෘෂිකාර්මික කටයුතු අඩාල වීම
- නිල්පොත නැමති සංඛ්‍යා ලේඛන සංග්‍රහයට කරුණු රැස්කිරීම පිළිබඳ ජනතාව තුළ තිබූ සැකය
- ඉංග්‍රීසීන් බුදුදහම සඳහා මෙතෙක් ලබා දුන් ආරක්ෂාව ඉවත් කිරීම
- .....

1840 වාර්ෂිකය පමණ අග භාගයේ අත්හිටුවීම වැඩිවිය.

(ලකුණු 03 + 03 = 06 යි.)

07. ඉගෙනුම් පල :

- නිදහසට පෙර ශ්‍රී ලංකාවේ බිහි වූ දේශපාලන පක්ෂ නම් කරයි.
- ක්‍රි.ව. 1956 දී ශ්‍රී ලංකාවේ බලයට පත් රජය හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ ලියා දක්වයි.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපතිවරයා සතු බලතල නම් කර දක්වයි.
- නිදහසින් පසු මුල් දශක තුන තුළ දී ලංකාවේ සමාජ සුබ සාධනය වැඩි දියුණු කිරීමට ගත් පියවර විස්තර කරයි.

7. (i) නිදහසට පෙර ශ්‍රී ලංකාවේ බිහිවූ දේශපාලන පක්ෂ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(ii) ක්‍රි.ව. 1956 දී ශ්‍රී ලංකාවේ බලයට පත් රජය හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපතිවරයා සතු බලතල **දෙකක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 05 යි)
(iv) නිදහසින් පසු මුල් දශක තුන තුළදී ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධනය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i)

- කම්කරු පක්ෂය
- ලංකා සම සමාජ පක්ෂය/ සම සමාජ පක්ෂය
- ලංකා කොමියුනිස්ට් පක්ෂය/ කොමියුනිස්ට් පක්ෂය
- එක්සත් ජාතික පක්ෂය (ප.N.P/ඒ.ජා.ප)
- ද්‍රවිඩ සංගමය
- බොල්ෂේවික් ලෙනින් පක්ෂය
- ලංකා ත්‍රොට්ස්කි සංවිධාය

(ලකුණු 01 x 03 = 03 යි.)

(ii)

- සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම
- බ්‍රිතාන්‍ය සමඟ අත්සන් කර තිබූ ආරක්ෂක හා බාහිර කටයුතු පිළිබඳ ගිවිසුම් අහෝසි කිරීම
- වරාය හා බස් ජනසතු කිරීම ප්‍රමුඛ ජනසතු ව්‍යාපාරය
- පිරිවෙන් විශ්ව විද්‍යාල කිරීම

- මයර් සම්මේලනය, බාහිර කටයුතු ගැලපුම, රේගු සම්මුතිය (නුල්ගහ/බෙස්ගොමු)
- නාම්නිර්වය දියුණු කිරීම.

(ලකුණු 02 x 02 = 04 යි.)

(iii)

- ව්‍යවස්ථාදායකය හා සම්බන්ධ බලතල
  - පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම, පාර්ලිමේන්තු රැස්වීමේ මුලසුන දැරීම
  - .....

- විධායකයේ ප්‍රධානියා ලෙස බලතල
  - අගමැති ඇතුලු ඇමැති මණ්ඩලය පත් කිරීම
  - ඇමැතිවරුන්ට විෂය හා කාර්ය පැවරීම
  - .....
- අධිකරණ ක්ෂේත්‍රයේ බලතල
  - අග්‍ර විනිශ්චයකාරතුමා පත් කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු පත් කිරීම
  - .....
- රාජ්‍ය නායකයා ලෙස හිමි බලතල
  - යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
  - රාජ්‍ය උත්සවවල මුලසුන ගැනීම
  - .....

(ලකුණු 02 +03 = 05 යි.)

(iv)

- ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන කටයුතු දියුණු කිරීම
- රැකියා ලබා ගැනීමේ දක්ෂතාව හා තරඟ විභාග ක්‍රම යෙදීම
- නිදහස සමානාත්මතාව හා මූලික අයිතිවාසිකම් වැනි සංකල්ප ව්‍යවස්ථා ගත කිරීම
- කෘෂි කාර්මික හා ධීවර කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම
- ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය සේවා දියුණු කිරීම
- ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීම
- ආහාර සහනාධාර ලබා දීම අඛණ්ඩව පවත්වා ගෙන යාම
- නිවාස ගැටලුව විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම

(ලකුණු 06යි)

III කොටස

08. **ඉගෙනුම් පල :**

- බ්‍රිතාන්‍යයේ ආරම්භ වූ කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් නම් කරයි.
- කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු ලියා දක්වයි.
- කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු කර්මාන්තයේ ඇති වූ දියුණුව නිදසුන් දක්වමින් විස්තර කරයි.
- කාර්මික විප්ලවය හේතු කොට ගෙන ලෝක ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් විස්තර කරයි.

8. (i) බ්‍රිතාන්‍යයේ ආරම්භ වූ කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලවය පළමුව බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු කර්මාන්තයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) ප්‍රංශය, ජර්මනිය, බෙල්ජියම, ඔස්ට්‍රියාව, හංගේරියාව, ප්‍රුෂියාව

(ලකුණු 01 X 03 = 03යි.)

(ii)

- කර්මාන්ත සඳහා ආයෝජනය කළ හැකි ධනවත් පිරිසක් සිටීම
- බ්‍රිතාන්‍යයේ ජනගහන වර්ධනය නිසා දේශීය වෙළෙඳපොල පුළුල් වීම
- යුරෝපා පුනරුදයෙන් ලැබුණු කාර්මික ඥානය යන්ත්‍ර සූත්‍ර නිපදවීම සඳහා යොදා ගැනීම
- කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා බලශක්තිය සුලභ වීම
- යටත් විජිත නිසා පුළුල් විදේශීය වෙළෙඳපොලක් පැවතීම
- ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා අතිරික්ත ශ්‍රමය ලබා ගත හැකි වීම
- කර්මාන්ත හා ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය සපයන බැංකු හා මූල්‍ය ආයතන බිහිවීම
- බ්‍රිතාන්‍යයේ පැවති දේශපාලන ස්ථාවරත්වය
- ලන්ඩන් නගරය අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය, නිෂ්පාදන ද්‍රව්‍ය බෙදාහරින මධ්‍යස්ථානයක්ව පැවතීම
- වෙනත් ප්‍රශ්නය රටවල් ඇතෙව් වැනිම ඒ විදෙස් වෙළෙඳපොළ ඒකාධිපත්‍ය කරගැනීම.

(ලකුණු 02 X 02 = 04 යි.)

(iii)

- ක්‍රි.ව.1735 දී තෝමස් නිව්කොමන් විසින් ආකරවල ජලය නල මගින් ඉවත් කිරීමට හා වාතය කෘත්‍රිම ලෙස සිසිල් කිරීම සඳහා වාෂ්ප එන්ජිමක් නිපදවීම
- ක්‍රි.ව. 1736 දී ජේම්ස් වොට් විසින් නිව්කොමන් ගේ වාෂ්ප එන්ජිම වැඩි දියුණු කොට විධිමත් වාෂ්ප එන්ජිමක් නිපදවීම
- ක්‍රි.ව. 1812 දී හම්ප්‍රිඩේවි විසින් ආරක්ෂක ලාම්පුව නිපදවීම නිසා ආකරවලට ආලෝකය ලබා ගැනීම පහසු වීම
- ක්‍රි.ව. 1839 දී යකඩ කේබල් මගින් ආකරවල ගල් අඟුරු පිටතට ගෙන ඒම
- ගල් අඟුරු කර්මාන්තයේ අතුරු පල විවිධ කටයුතු සඳහා යොදා ගැනීම
- දුම් වෙනුවට ගල් අඟුරු භාවිතා කිරීම.

(ලකුණු 02 + 03 = 05යි.)

(iv)

- කාර්මික නිෂ්පාදන පුළුල් වීම
- වෙළෙඳ හා වානිජ කටයුතු ආර්ථික ක්ෂේත්‍රයේ පෙරමුණ ගැනීම
- ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටී, වැටුප මත සේවය කරන කම්කරු පිරිසක් බිහිවීම
- කෘෂි නිෂ්පාදන කටයුතු කාර්මීකරණය වීම
- ආනයන - අපනයන ආර්ථිකයන් වර්ධනය වීම
- වෙළෙඳ කටයුතු සඳහා ආයෝජනයට බද්ධ ව්‍යාපාර සමාගම් බිහිවීම
- ධනවාදී ආර්ථික රටාව ලොව පුරා ව්‍යාප්ත වීම

(ලකුණු 03 + 03 = 06 යි.)

09. **ඉගෙනුම් පල :**

- පළමුවන ලෝක මහා සංග්‍රාමයේ දී මිත්‍ර පිලට අයත් රටවල් නම් කරයි.
- පළමුවන ලෝක මහා සංග්‍රාමය ඇති වීමට බලපෑ හේතු දක්වයි.
- දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක දේශපාලනයේ හටගත් වෙනස්කම් විස්තර කරයි.
- ලෝක සාමය ආරක්ෂා කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරයි.

9. (i) පළමුවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන ලෝක මහා සංග්‍රාමය ඇති වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල ලෙස ලෝක දේශපාලනයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ලෝක සාමය ආරක්ෂා කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය, රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය

(ලකුණු 01 x 03 = 03 යි.)

(ii)

- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේදී ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත් වීම
- ජර්මන් අධිරාජයා වූ දෙවන විලියම්ගේ ක්‍රියා කලාපය
- යටත් විජිත පිහිටුවා ගැනීම සඳහා වූ තරඟය
- අවි තරඟය හා ජාතිවාදය වර්ධනය වීම
- ප්‍රංශය යුරෝපය තුළ තනි කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය
- ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුන් ඝාතනය කිරීම

(ලකුණු 02 x 02 = 04 යි.)

(iii)

- අධිරාජ්‍යවාදී සංකල්පය බිඳ වැටී යටත් විජිතවලට නිදහස ලැබීම
- විනාශයට පත් යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීමට මාර්ෂල් සැලස්ම ක්‍රියාත්මක කිරීම
- ධනවාදී හා සමාජවාදී යනුවෙන් බල කඳවුරු දෙකක් බිහි වීම
- නිරවි යුද්ධය ක්‍රියාත්මක වීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම
- බල කඳවුරුවලට ගැති නොවූ රටවල් නොබැඳි ජාතීන් ලෙස සංවිධානය වීම
- අවර්තනට සම්බන්ධයක ලෙස සලකුණු වීම/ක්‍රියාත්මක හා ප්‍රංශය පර්වලවීම.

(ලකුණු 02 + 03 = 05 යි.)

(iv)

- ආර්ථික සම්බාධක පැනවීම
- න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කිරීම
- සාම සාධක හමුදාව යෙදවීම
- සාම සාකච්ඡා සඳහා යොමු කිරීම
- අවශ්‍ය වටක ලෙස සාධක සඳහා ප්‍රධාන ලෙස යෙදවීම.
  උදා: උතුරු කඳවුරු නෙරියා අර්බුදය,
  නොගෙන් අර්බුදය

(ලකුණු 03 + 03 = 06 යි.)